
# කොකාගේ උදව්ව



චිති ඉෂිප්‍රභා රත්තිලක

**කොකාගේ උදව්ව**

**චිති ඉෂිප්‍රභා රත්තිලක**

**කතෘ ප්‍රකාශන**

**ISBN අංකය: ISBN 978-624-206-886-2**

සියලු හිමිකම් ඇවරිණි...

චිත්‍ර: චිති ඉෂිප්‍රභා රත්තිලක

කෘතිය පළ කරන දිනය: 2023.12.04

# පිදුම

මගේ මේ පුංචි කතන්දර පොත

ආදරණීය දිල්රුක්ෂි ගුරුතුමියට

හද බැතියෙන් පුදමි!

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදයී පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප් රඥසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. ඒසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගනණක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙනලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදයක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිදින විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනම

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

එකමත් එක රටක ලස්සනම ලස්සන කැලෑවක් තිබුණා.ඒ කැලෑවේ ලස්සන දියඇළි,ගස්,මල් එහෙමත් තිබුණා.එක එක සත්තුත් ගොඩක් හිටියා.



ඒ වගේම ඒ කැලෑවේ තිබුණා ලස්සන විලක්.ඒ විලේ පුංචි මාළු පැටවු ගොඩක් හිටියා.ඒ විලේ ලස්සන මල් පිපිලා තිබුණා.



ඔන්න දවසක් කෑම හොයාගෙන පියඹාගෙන ගිය කොකෙක් ඒ විලට ආවා.කොකාට හොඳටම බඩගිනි වෙලයි හිටියෙ.ඉතින් කොකා ඒ විලේ උඩ පැන පැන හිටපු මාළු දිහා හරි ආසාවෙන් බලාගෙන හිටියා.



ඊට පස්සේ සද්ද නොකර හෙමින් හෙමින් එක එක මාළු අල්ලගෙන කන්න පටන් ගත්තා.කොකාට බය වෙලා සමහර මාළු විලේ තිබ්බ ගල් අස්සෙයි නෙළුම් කොළ අස්සෙයි හැංගුණා.ඒත් කොකා කොහොමහරි මාළු අල්ලගෙන කෑවා.



විල ගාවින් ඉගිලගෙන ගිය තවත් පුංචි පිළිහුඩු පැටියෙක් කොකා මාළු අල්ලන විදිහ හරි ආසාවෙන් බලන් හිටියා.ඒ පිළිහුඩු පැටියා තවම පුංචි නිසා එයාට  මාළු අල්ලන්න බෑ.



ඉතින් මේ පුංචි පිළිහුඩු පැටියා බඩගින්නෙම මාළු අල්ලන්න බයෙන් එතන තිබ්බ ගහක අත්තක වහලා හිටියා.ඒක දැකපු කොකාට හරියට දුක හිතුණා.හැබැයි කොකාට පිළිහුඩු පැටියට මාළු දෙන්න පුංචි ලෝභකමකුත් ඇතිවුණා.



ඉතින් කොකා ටිකක් වෙලා කල්පනා කර කර හිටියා. පුංචි පිළිහුඩු පැටියා අසරණව කොකා දිහා බලන් හිටියා.කොකාට තවත් දුක හිතුණා. එතකොට කොකාට එයා පුංචි කාලේ එයාගෙ අම්මා එයාට කියල දුන්න කතාවක් මතක් වුණා.



කොකා පුංචි කාලෙදී එයාගෙ අම්මා එයාට කියලා දීලා තිබුණා අනික් අයට උදව් කරන එක හොද දෙයක් කියලා. ඒ නිසා හැම වෙලාවකම තමන් ගැන වගේම අනිත් අය ගැනත් හිතන්න කියලත් කියලා දීලා.

ඒක මතක් වුණ කොකා පුංචි පිළිහුඩු පැටියට උදවු කරන්න හිතුවා.



කොකා එක එක මාළු අල්ලගෙන ගිහින් පිළිහුඩු පැටියාට දුන්නා. පිළිහුඩු පැටියාට හරිම සතුටුයි. කොකාටත් එයා කරපු හොඳ වැඩේ නිසා එයා ගැනම ලොකු සතුටක් දැනුණා. කොකා හිතාගත්තා ආයෙ හැමදමත් එයාට පුළුවන් විදිහට අනිත් අයට උදව් කරනවා කියලා. ඊට පස්සේ කොකයි පිළිහුඩු පැටියායි දෙන්නම සතුටින් කතා කර කර ඉදලා හවස් වෙන්න කලින් විල ගාවින් පියාඹලා යන්න ගියා.





**චිති ඉෂිප්‍රභා රන්තිලක**

**1 ශ්‍රේණිය E**

**මහ/මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප් රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය . පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප් රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි . පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු..

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01